*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

# සිංහල භාෂාව හා සාහිත්‍යය

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01, 02 හා 03 ප්‍රශ්නවල ඉරි ඇඳි යෙදුම්වල අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පාඨය තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සිය පුතාගේ විභාග ප්‍රතිඵල දුටු මවගේ <u>**ඉහේ මලක් පිපුණි**</u>

(i) සිදුවිය නොහැකි දෙයක් සිදුවීම (ii) ඉමහත් ප්‍රීතියට පත්වීම

(iii) හිසේ මලක් පිපීම (iv) හිසට බරක් දැනීම

02 තාත්තා වේගයෙන් එනු දුටු සුනිමල්ට <u>**හීන් දාඩිය දැම්මේය**</u>

(i) හොඳට ම බය විය. (ii) හොඳට ම දාඩිය දැම්මා.

(iii) හීනියට දාඩිය දැම්මා. (iv) දාඩිය නිසා අත තෙත් වුණා.

03 බසය පැදවූ රියදුරා <u>**ලැල්ලට පාගා ගියේය.**</u>

(i) ලැල්ල පාගාගෙන ගියේය. (ii) ලැල්ලෙන් පැන ගියේය.

(iii) ඉතා වේගයෙන් ගියේය. (iv) ලැල්ල දෙස නොබලාම ගියේය.

04 දී ඇති පදයට සමානාර්ථයක් දෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කීර්තිය (අයස, අපකීර්තිය, අභිමානය, යසස)

(ii) ප්‍රවීණ (ප්‍රාචීන, නිපුණ, ප්‍රතිවීන, නවීන)

05 දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අන්ත (අන්තර, සමාන්තර, අනන්ත)

(ii) අවමාන (අසමාන, විමාන, සම්මාන)

- **අංක 06 හා 07 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පමණක් අඩංගු පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.**

06 (i) උපකරන, අසම්පූර්ණ, වර්න (ii) ශිෂ්ටාචාරය, නිශ්ශබ්ද, නිෂ්ඵල

(iii) විශිෂ්ට, විෂ්මය, කොට්ඨාශය (iv) ආශ්වාද, ප්‍රස්තාර, නිෂ්ඵල

07 (i) ප්‍රස්තාර, ආභාසය, වර්ධනය, දේශනය (ii) ප්‍රස්ථාර, ආභාෂය, වර්ධනය, දේශනය

(iii) ප්‍රස්තාර, වර්දනය, දේශණය, ආභාෂය (iv) ප්‍රස්ථාර, වර්ධණය, දේසනය, ආභාසය

08 පහත දක්වා ඇති උක්ත පද සඳහා අනුක්ත පද ලියන්න.

(i) දූරියක් ............................. (ii) කුරුල්ලෝ .............................

09 මුලින් දී ඇති ක්‍රියාපද වර්ගයට ගැළපෙන ක්‍රියා පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) පූර්ව ක්‍රියා (දුවදුවා, නටමින්, ගොස්)

(ii) මිශ්‍ර ක්‍රියා (බලා, පනිමින්, සැදේවා)

10 පහත දක්වා ඇති වචන සඳහා කමත් භාෂාවේ භාවිත කරන වචන හිස්තැනෙහි ලියන්න.

(i) තේ වතුර ................................ (ii) කුල්ල ................................

(iii) දෑකැත්ත ................................ (iv) වී ................................

11 පහත දී ඇති වාක්‍යයේ සඳහන් වන උපසර්ග සහිත පද දෙක තෝරා ලියන්න.

ගුරුතුමී දරුවන්ට පරසිරිතට ගැති නොවී අභිමානයෙන් කටයුතු කිරීමට උපදෙස් දුන්නාය.

(i) ................................ (ii) ................................

12 පහත දක්වා ඇති පුරුෂ ලිංග නාම පද සඳහා යෙදෙන ස්ත්‍රී ලිංග නාම පද ලියන්න.

(i) සොරා ................................ (ii) අශ්වයා ..............................

(iii) මීයා ................................ (iv) කවුඩා ..............................

13 පහත සඳහන් පද සමූහය සඳහා ගැළපෙන තනි පදය ඉදිරියෙන් ලියන්න.

(i) පළමු වතාවට සිරිපා කරුණාකරන්නා ..........................................................................

(ii) සිතුවම් අඳින ලද වස්ත්‍රය ..........................................................................

14 පහත සඳහන් කවි පදයේ ඇති සඤ්ඤක අකුරු සහිත වචන දෙකක් තෝරා ලියන්න.

නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි

(i) ...................................................... (ii) ...............................................................

15 පහත සඳහන් ගී පද කොටසෙහි ඇතුළත් නාම විශේෂණ පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් තෝරා ලියන්න.

"පුංචි කුරුල්ලා ඉඹලා - මහ හයියෙන් විලාප දුන්නා......"

(i) නාම විශේෂණය ................................ (ii) ක්‍රියා විශේෂණය ....................................

16 පහත දක්වා ඇති වචනවල බහුවචන පදය ඉදිරියෙන් ලියන්න.

(i) චාරිත්‍රය ............................... (ii) වළ .................................

(iii) අම්බරුවා ............................... (iv) මහල්ලා .................................

17 පහත දැක්වෙන වාක්‍යයේ සඳහන් උත්තම පුරුෂ නාම පදය සොයා ලියන්න.

අම්මා පොළට ගොස් එනතුරු මම නංගී බලාගෙන නිවසේ සිටියෙමි.

.................................................................................................................................................................

18 පහත සඳහන් කවිය සඳහා සුදුසු පද දෙකක් නිර්මාණය කරන්න.

ටික්කි ටිකිරි වතුසුදු මල් සිල් අරගෙන මෙනි හැමකල්

............................................................ .....................................................................

19 පහත වාක්‍යයේ නිවැරදිව පද බෙදා **<u>නැති</u>** වචන දෙක යටින් ඉරි අඳින්න.

ළමයි ගල් කැට වලින් කුරුල්ලන් ට ගසති.

20 පහත සඳහන් වාක්‍යය සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

කළුහාමි මොකද මේ කෝ අස්පයා මිනිහා හම්බවුණේ නැද්ද

(ලකුණු 2 × 20 = 40)

# II කොටස

- **ප්‍රශ්න අංක 1, 2, 3 ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i) පහත සඳහන් වචන දෙක යොදා අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

(අ) වනය (ආ) වණය

(ii) තොප්පි වෙළෙන්දා නාට්‍යය නිර්මාණයේ රචකයා කවුද?

(iii) ක්‍රියා පදවල මූලික කොටස් දෙක නම් කරන්න.

(iv) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු දෙක සම්පූර්ණ කරන්න.

(අ) ඉගුරු දී ......................................................................................... වගෙයි

(ආ) ....................................................................වීණා ගායනා කරනවා වගෙයි

(v) සිංහල අක්ෂර මාලාවේ

(අ) ස්වර අක්ෂර ගණන කීයද?

(ආ) ව්‍යඤ්ජන අක්ෂර ගණන කීයද? (ලකුණු 2 × 5 = 10)

02 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) ලොව දිනන දරුවෝ අපි වෙමු

(ii) පොදු දේපළ සුරකිමු

(iii) ලෝකයට ම තර්ජනයක් වන කොරෝනා පරදවමු

(iv) සෞඛ්‍යාරක්ෂිත ආහාර පුරුදු ඇති කර ගනිමු

03 ඔබ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වෙන වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගි වන ලෙස ඉල්ලමින් ආරාධිතයන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

04 පහත සඳහන් අක්ෂර යෙදෙන වචනය බැගින් ඉදිරියෙන් ලියන්න.

(i) ඛ (ii) ඡ (iii) ඨ (iv) ඪ

(v) ඵ (vi) ඝ (vii) ඣ (viii) ඞ

(ix) ධ (x) භ (ලකුණු 10)

**05** (අ) පහත සඳහන් වාක්‍යවල ආඛ්‍යාත පද අතීත කාලයට හරවා ලියන්න.

(i) බකමූණෝ යාග කරති.

(ii) කම්මල්කරුවෝ ආයුධ තනති.

(iii) බළංගොඩ යපස් මතු වෙයි.

(iv) ශිල්පීහු තම කටයුතු වල නියැළෙති.

(v) දෙදෙනෙක් මයිනහම අදිති.

(ආ) පහත සඳහන් වාක්‍යවල ආඛ්‍යාත පද අනතීත කාලයට (වර්තමාන / අනාගත) හරවා ලියන්න.

(i) පුරාවිද්‍යාඥයා කරුණු අනාවරණය කළේය.

(ii) සල් ගසෙහි මල් පිපුණේය.

(iii) මාමා අප බලන්නට පැමිණියේය.

(iv) අම්මා පුතුට කිරි පෙව්වාය.

(v) අපි මිහිරි හඬින් ගී ගැයුවෙමු (ලකුණු 1 x 10 = 10)

06 පහත සඳහන් පාඨ,

(i) ඇතුළත් පාඩමේ නම

(ii) කා විසින් කාට කියන ලද්දක්දැයි ලියන්න.

(i) "අනේ කමක් නෑ හාමිනේ

පුංචි අයගේ ආසාවනේ

හා ! හා !! හා !!! යන්න යන්න."

(ii) "එහෙනම් මට දුවන්නට බැරි වෙන්නට අපි වලිග ගැට ගසා ගනිමු."

(iii) "පුතේ මේ සේරම අපේ චාරිත්‍ර පාවර ආරක්ෂා කරන්නටයි මේ සිරිත් කරන්නේ....."

(iv) " නුඹ වහන්සේ පස්සේ යන අතවැසි තුන් වාරයක් මාගේ තල ඇරගෙන ඉනිබ්බේත් තල ගනිත් නම් මාගේ තල නිමන්නේය."

(v) "ඔත්තු බලන ගමන් ම ටිකට් විකුණන කෙනෙකුත් වෙන්න මට බැරිද?" (ලකුණු 2 x 5 = 10)

07 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත සැළලිහිණි සංදේශයේ "ශ්‍රී පාදය" වර්ණනා කරන්නේ එලෙසිනි. මෙයින් නැගෙන්නේ ශ්‍රී පාදස්ථානයත් සුමන සමන් දෙවියනුත් අතර පවතින සම්බන්ධය යි. බුදු රජාණන් වහන්සේ තෙවන වර ලංකාවට වැඩම කළ අවස්ථාවේ දී සමන් දෙවිඳු සිය වාසස්ථානය වූ සමන්ත කූටයට වඩින ලෙස උන් වහන්සේට ආයාචනය කළේය. ඒ අනුව සමන්ත කූඨයට වැඩම කළ බුදුන් වහන්සේ තම පා සලකුණ එම කඳු මුදුනෙහි පිහිටුවා පසෙක පිහිටි දිවා ගුහාවට වැඩ එහි දිවා විහරණය කළ සේක. මේ බව පතිරජ පිරුවන්පති වේදේහ හිමි සමන්ත කූට වර්ණනාව නම් ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. මගුල් ලකුණු එක සිය අටක් ශ්‍රී පාද ලාංඡනයෙහි පිහිටා ඇති බව ද කියැවේ. මුහුදු මට්ටමේ සිට අඩි හත්දහස් තුන්සිය හැටක (7360) උසකින් පිහිටි සමන්තකූට පර්වතය සබරගමුවේ පිහිටි ප්‍රාග් ඓතිහාසික වැදගත්කමකින් යුක්ත වූ ඉතා ම සුන්දර ස්ථානයකි.

(i) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත මෙහි සඳහන් ග්‍රන්ථය කුමක් ද?

(ii) බුදුන් වහන්සේ සමන්තකූටයට වැඩියේ කාගේ ආරාධනාවකට ද?

(iii) ශ්‍රී පාද ලක්ෂණයේ ඇති මඟුල් ලකුණු කීයක් ගැන මෙහි කියවෙයි ද?

(iv) මෙහි සඳහන් ඓතිහාසික ස්ථානය පිහිටි පළාත කුමක් ද?

(v) පහත සඳහන් පද දෙක සඳහා යෙදිය හැකි සමානාර්ථ පද දෙකක් ඡේදයෙන් සොයා ලියන්න.

(අ) කෘතිය ......................................................................

(ආ) ලකුණ ...................................................................... (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) (ii) (02) (i) (03) (iii) (04) (i) යසස (ii) නිපුණ (05) (i) අනන්ත (ii) සම්මාන

(06) (ii) (07) (i) (08) (i) දූරියක (ii) කුරුල්ලන් (09) (i) ගොස් (ii) පනිමින්

(10) (i) රතු ගඟුල (ii) යතුර (iii) ලියන්නාව (iv) බැත (11) (i) පරසිරිතට (i) අභිමානයෙන්

(12) (i) සෙර (ii) වෙළඹ (iii) මීච්චි / මීවිය (iv) කැවිඩිය (13) (i) කෝඩුකාරයා (ii) පෙතිකව

(14) සුවඳ / කුඹු / අඹ (15) (i) පුංචි (කුරුල්ලා) (ii) හයියෙන් (16) (i) චාරිත්‍ර (ii) වළවල්

(iii) අම්බරුවෝ (iv) මහල්ලෝ (17) මම (18) සුදුසු පද සඳහා ලකුණු ලබා දෙන්න

(19) කැටවලින්, කුරුල්ලන්ට (20) කළුහාමි : මොකද මේ, කෝ අස්පයා, මිනිහා හම්බවුනේ නැද්ද?

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) වනය - කැලය වණය - තුවාලය (අරුත් එන පරිදි යෙදූ වාක්‍ය සඳහා ලකුණු ලබා දෙන්න)
(ii) සෝමලතා සුභසිංහ මහත්මිය (iii) (අ) අවසාන ක්‍රියා(ආ) අනවසාන ක්‍රියා
(iv) (අ) මිරිස් ගත්තා (ආ) බීරි අලින්ට (v) (අ) 18 (ආ) 42 (ලකුණු 2 x 5 = 10)

02 සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න (ලකුණු 20)

03 සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න (ලකුණු 10)

04 නිවැරදිව ලියා ඇති වචන සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

05 (අ) (i) කළහ / කළෝය (ii) තැනූහ / තැනුවෝය (iii) විය
(iv) නියැලුණාහ / නියැලුණෝය (v) ඇන්දහ / ඇන්දෝය
(ආ) (i) කරයි (ii) පිපෙයි (iii) පැමිණෙයි (iv) පොවන්නීය (v) කියමු
(ලකුණු 1 x 10 = 10)

06

| | පාඩමේ නම | කීවේ කවුද | කීවේ කාටද |
|---|---|---|---|
| (i) | තොප්පි වෙළෙන්දා | වෙළෙන්දා | ළමයාගේ මවට |
| (ii) | ගොවි බිරියගේ නුවණ | හිවලා | ව්‍යාඝ්‍රයාට |
| (iii) | ඔයි රයිරේ ඔයිරාමා | දාවිත් රාළහාමි | ළමයින්ට |
| (iv) | තිලමුට්ඨි ජාතකය | මැලි ස්ත්‍රිය | දිසාපාමොක් ආචාරීන්ට |
| (v) | කතා බහට සංයමයක් | ටොට්ටෝ චං | මවට |

(ලකුණු 2 x 5 = 10)

07 (i) සැලළිහිණි සන්දේශය (ii) සමන් දෙවිඳු
(iii) එකසිය අටක් (iv) සබරගමුව
(v) ග්‍රන්ථය, ලාංඡනය (ලකුණු 10)